# නිදහස සහ ශ්‍රීලංකා ව්‍යවස්ථාදායකය



The old Parliament building in Colombo, Sri Lanka. This photograph was taken on Vesak Day - 15th May 2003 - by late Ajith Dahanayake.



ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී

මේජර් වී. බී. කරුණාරත්න විසිනි
Oxford - UK



ශ්‍රීලංකාවට නව ජනරජ ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට සාකච්ඡා කිරීම සඳහා 1970 ජූලි 19 වෙනි දින සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය කොළඹ නව රඟහලට පැමිණේ. එතුමියගේ දෙපසින් එම රජයේ ඇමති වරුන් දෙදෙනෙකු වන ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතා සහ පීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා ද වෙති.

ක්සියම් රාජ්‍යයකට පූර්ණ නිදහස ලැබීම යනු එම රාජ්‍යයට ආර්ථික, දේශපාලන සහ අධිකරණ කටයුතු වෙනත් රාජ්‍යයකට නතු නොවී කරගෙන යාමට අවස්ථාව ලැබීමයි. මෙයින් වඩා වැදගත් වන්නේත්, නිදහස අර්ථවත් වන්නේත්, දේශපාලන නිදහස ලැබීම තුළිනි. දේශපාලන නිදහස ලද රාජ්‍යයකට තම රාජ්‍යයෙහි ව්‍යවස්ථාදායකයක් හෙවත් නීති රීති යෝජනාකොට සාකච්ඡා කිරීමෙන් අනතුරුව අනුමතකර ගැනීමේ උත්තරීතර ආයතනයක් පිහිටුවාගත හැකි ය.

1948 පෙබරවාරි 4 වෙනි දින ශ්‍රීලංකාවට මහා බ්‍රිතාන්‍යය විසින් ප්‍රදානය කරන ලද්දේ එවැනි නිදහසකි. එනම් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට නතු නොවී ශ්‍රීලංකා පාර්ලිමේන්තුවට උත්තරී තර ව්‍යවස්ථාදායකය ලෙස ක්‍රියාකිරීමට නිදහස ලබාදීමයි. ශ්‍රීලංකාව නිදහස ලබා වසර 61 ක් ගතවෙන මෙම අවස්ථාවේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා දායකයෙහි විකාශනය පිළිබඳව සාකච්ඡාකිරීම කාලෝචිතය.

ශ්‍රීලංකාවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය ඉටුකරන වත්මන් පාර්ලිමේන්තුව කලින් කලට විවිධ නම්වලින් හඳුන්වා ඇත. 1815 මාර්තු 2 වෙනි දින අත්සන් කළ උඩරට ගිවිසුම ප්‍රකාරව පරිපාලන හා ව්‍යවස්ථාදායක කටයුතු ඉටු නොවීම ගැන නොසන්සුන්වූ ශ්‍රීලාංකිකයන් අස්වසාලීමට බ්‍රිතාන්‍යයෝ කටයුතු යෙදූහ.

නොසන්සුන්තාව වටහාගත් එවක බ්‍රිතාන්‍ය රජය ශ්‍රීමත් විලියම් කෝල්බෲක්ගේ ප්‍රධානත්වයෙන් නියෝජිත පිරිසක් ලංකාවට එවා ලංකාවට සුදුසු ව්‍යවස්ථාදායකයක් පිහිටුවාලීමට නිර්දේශ ලබාගත්තේය. එම නිර්දේශ කෝල්බෲක් යෝජනා නමින් ප්‍රසිද්ධ වූ අතර ශ්‍රීලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාදායකය ශ්‍රීලංකා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව නමින් 1833 මාර්තු 28 වෙනි දා ස්ථාපිත කෙරිණ.

1910 දී මෙම ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ සුළු ප්‍රතිසංස්කරණ කිහිපයකින් පසු ව්‍යවස්ථා දායක සභාව ලෙසින්ද, 1931 දී ඩොනමෝර් යෝජනා ක්‍රම අනුව පිහිටවූ ව්‍යවස්ථා දායකය රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙසින් ද හැඳින්විණ.

1931 පිහිටවූ රාජ්‍ය මන්ත්‍රණ සභාව වත්මන් පාර්ලිමේන්තුවේ ආකෘතිමය ආරම්භය ලෙස සැලකේ. 1931 වන තුරුම ව්‍යවස්ථා දායකයේ මූලසුන හෙබවූයේ අග්‍රාණ්ඩුකාරවරයා වුවද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලසුන සඳහා කතානායකවරයෙකු පත්කරගනු ලැබීය. රජයේ කටයුතු කරගෙන යාමට අමාත්‍ය මණ්ඩලයක් පත් කෙරුණු අතර අගමැතිවරයෙකු නොවීය. අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභානායකවරයා ක්‍රියා කළ අතර කැබිනට් මණ්ඩලය ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීය.

1947දී ඉන්දියාවේ ආණ්ඩුකාරයාවූ සෝල්බරි සාමිවරයා සහ අයිවර් ජෙනිංග්ස් නම් දේශපාලන විශේෂඥයා ඉදිරිපත් කළ සෝල්බරි කොමිෂන් යෝජනා නමින් ප්‍රකට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රීලංකාව දේශපාලනික වශයෙන් පූර්ණ නිදහසද, යම්යම් සීමාවන්ට යටත්ව ව්‍යවස්ථාදායක බලයද, අධිකරණ හා ආර්ථික නිදහසද ලැබීය. ව්‍යවස්ථා දායකය පාර්ලිමේන්තුව යනුවෙන් හැඳින්විණ.

මෙම ක්‍රියාවලිය සම්පූර්ණකරගනු පිණිස 1948 පෙබරවාරි 4 වෙනි දින බ්‍රිතාන්‍යය විසින් ශ්‍රීලංකාවට පූර්ණ නිදහස ප්‍රදානය කරන ලදී. එහිදී විශේෂත්වයක් වූයේ 1947 වන තෙක්ම ශ්‍රීලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය රජයේ ප්‍රසාදය මත පත්වූ අතර 1948 පෙබරවාරි 4 වෙනි දින එම ආණ්ඩුකාරවරයා ලෙස පත්වන තැනැත්තා ශ්‍රීලංකා අගමැතිගේ නිර්දේශය මත පත්කිරීමයි. තවද ආර්ථික කටයුතු මෙහෙය වීමට ශ්‍රීලංකා මහා බැංකුවද, ශ්‍රීලංකා සන්නද්ධ හමුදාවන් පිහිටුවීමටද මෙ මගින් ඉඩ ලැබිණ. අධිකරණ කටයුතුවල අවසාන තීරණ ගැනීමේ ක්‍රියාවලිය මහා බ්‍රිතාන්‍යය සතුවූ අතර ශ්‍රීලංකාව මහ රජුගේ ආණ්ඩුවක් ලෙස හඳුන්වාදීමට ද බ්‍රිතාන්‍යය කටයුතු යෙදුවා ය.

එසේ සීමාවන්ට ගොදුරුවූ නිදහස පිළිබඳව ශ්‍රීලාංකිකයන්ගෙන් විවිධ විවේචන එල්ල විය. එවකට සමසමාජ පක්ෂයේ නායකයෙකු වූ ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතා මෙය හැඳින්වූයේ අප ලද වල්බූරු නිදහසක් ලෙසය. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මෙම නිදහස ගැන ප්‍රකාශකරමින් කියා සිටියේ පූර්ණ නිදහස ලබාගැනීම සඳහා ලද නිදහසක් බවය.

එතුමාගේ එම ප්‍රකාශය අර්ථවත් කරමින් 1972 දී සමගි පෙරමුණ රජය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ නායකත්වය යටතේ ජනරජ ව්‍යවස්ථාව පිහිටවූ අතර ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින් විණ.

1972 මැයි 22 වෙනිදා සිට ක්‍රියාත්මක වූ ජනරජ ව්‍යවස්ථාවේ නිර්මාතෘ කොල්වින් ආර්. ද සිල්වාට බණ්ඩාරනායක මැතිණිය ප්‍රශංසා කළේ වල්බූරු නිදහස ඔබතුමා නැති කළා යනුවෙන් කියමිනි.

1972 දී සිදුවූයේ බ්‍රිතාන්‍යය සමග තිබුණු සියළු සීමාවන් සහ බැඳීම් වලින් නිදහස්වීමයි. විශේෂයෙන්ම අග්‍රාණ්ඩුකාර ධූරය අහෝසි-කොට නාම මාත්‍ර ජනපතිවරයෙකු පත්කිරීම, අධිකරණයෙහි අවසාන තීරණයන් සඳහා බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලයට ඉදිරිපත්වීමේ ක්‍රමය අහෝසිවීම, රජුගේ ආණ්ඩුව ලෙස හැඳින්වීම නතර කිරීම විශේෂයකි. බ්‍රිතාන්‍යයේ හොඳ හිත පවත්වාගෙනයාම පිණිස ශ්‍රී ලංකාව පොදුරාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු වී සිටීම ඉදිරියටත් සිදුවුණි.

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් 1948දී පෙන්වා දුන් පරිදි 1948 පෙබරවාරි 4 වෙනි දින අප රට ලද නිදහස පූර්ණ නිදහස ලබාගැනීම සඳහා ලබන ලද නිදහසකි. අද අප සමරණ එම නිදහස නොලැබෙන්නට 1972 දී ශ්‍රී ලංකාවට ජනරජයක්වීමට නොහැකි වනවා පමණක් නොව අද ක්‍රියාත්මක වන 1978 ව්‍යවස්ථාවද අනුමත කරගැනීමට නොහැකි වනු ඇත.

1978 දී ජේ ආර් ජයවර්ධන රජය විසින් හඳුන්දෙනු ලැබූ ව්‍යවස්ථාවෙන් ජාතික රාජ්‍ය සභාව නැවතත් පාර්ලිමේන්තුව නමින් හැඳින්වූ අතර ජනරජයක ලක්ෂණ සහිතව විධායක බලතල ඇති ජනපතිවරයා රාජ්‍ය නායකයා විය.

ශ්‍රීලාංකිකයන් වශයෙන් අප සැවොම 61 වන නිදහස සමරණ මේ මොහොතේ මෙවැනි ගමනක් ඒමට මගපෑදූ ව්‍යවස්ථාදායකයන් නිර්මාණය කළ විද්වතුන්ද, පාලකයන් සහ දේශපාලන නායකයන් ද සිහිපත්කිරීම වටී. එමෙන්ම අප ලබාගත් නිදහස ආරක්ෂාකර ගැනීමත්, ප්‍රජාතන්ත්‍රවාදී රාමුව යටතේ මහජන සුබසාධනය සහ යහපාලනය ඇතිකිරීමත් අපේ යුතුකම වන අතර මේ ලද නිදහස වල්බූරුවන්ට සරිලන වල්බූරු නිදහසක් නොවීමට වගබලාගත යුතුය.




## කියන තරම් යකා කලු නැති බව දැන් මුළු ලොවම දනී

මගේ ළඟ පරණ VHS විඩියෝ පටයක් තියනවා, 1990 දි විතර BBC චැනල් 4 ප්‍රවෘත්ති විකාශනය වෙද්දි එතකොට පාසැල් දැරියක්ව සිටි අපේ පොඩි දුව පටිගත කළ. ශ්‍රීලංකාව ගැන ඒ දවස්වල ගිය හැම ප්‍රවෘත්තියක්ම වැඩසටහනක්ම අපි පටිගත කළා. බීබීසී කැමරා කණ්ඩායමක් උතුරට ගිහිල්ලා එහේ කොටින්ගේ පුරාජේරුව රූපගත කරගෙන එනගමන් කොළඹ දි එවකට ආරක්ෂක ඇමතිව හිටිය රන්ජන් විජේරත්න මහත්තෙයා හමුවෙලා උන්නැහේ එක්ක කරපු සාකච්චාව. ඒකෙදි බීබීසී නියෝජිතයා අහනවා, " මේ එල්ටීටීඊ සංවිධානෙ ආණ්ඩුවට තර්ජනයක් නේද? යම් දවසක මේ කියන ඊළම දෙන්නත් රජයට සිද්ධවේවි නේද" කියලා. එතකොට ඇමතිවරයා හිනාවෙලා මෙහෙම කියනවා. "ඊළමක් මේ සම්ම ජාතියෙ උන්ට ලැබෙන්නෙ නැහැ. එල්ටීටීඊ කාරයො ත්‍රස්තවාදියො බව අපි දන්නවා. ඒ වුනාට උන්ට ඕන හැටියට නටන්න දෙන්නෙ නැහැ. ඔය ප්‍රභාකරනුයි මිනිහගෙ හෙංචයියො දෙතුන් දෙනයි අල්ල ගත්තම එතනින් වැඩේ ඉවරයි. ඒක ළඟදිම සිද්ධ වේවි."

එහෙම කියලා මාස කීපයකින් රන්ජන් විජේරත්න මහත්තෙයා කොටි බෝම්බෙකින් ජීවිතක්ෂයට පත්වුණා.

මම මේ සිද්ධිය මතක් කළේ කොටි සංවිධානෙ මුල් අවධියෙ ඉඳලා ඒක පරාජය කරන්න පුළුවන් බව අපේ නායකයො බොහොම දෙනෙක් දැනගෙන හිටි බව කියන්න. උන්ට බයේ හිටියෙ නැති බව කියන්න. ඒ කාලෙ අපේ ආණ්ඩුවල හිටි සමහර ලොක්කන්ට රජයේ හිටි දෙමළ නිළධාරි ලණු ගිල්ලවලා තිබුණා. කොටි කවදාවත් පරාජය කරන්න බැරි ජාතියක්, ඒ නිසා උන් එක්ක සාකච්ඡා කරමු කියලා. ඒව අහලා සමහර රජයවල් කළේ කොටි ශක්තිමත් වෙන බව හිතන්නෙ නැතුව යම් යම් පියවර වල් ගැනීම.

කාලය ඉක්ම යන කොට කොටි සංවිධානෙ අවබෝධකරගත්තා දේශපාලන වශයෙන් සිංහළ ජනතාව බෙදිලා ඉන්න බව. උන් ඒක උන්ගෙ උපරිම ප්‍රයෝජනේට ගත්තා. ඒ බෙදීම උඩ රටේ ජනමාධ්‍යයත් පක්ෂ වශයෙන් බෙදුණා. සමහර සිංහළ පත්තරවල මාධ්‍යකාරයො පවා කොටි ත්‍රස්තවාදි හැටියට නෙවෙයි කැරළිකාරයො හැටියටයි හුවා දැක්කුවෙ. උන් මහා බලසම්පන්න වීරයො ජාතියක් හැටියට පිළිගත්තා. මේ තත්වය නිසාම සාමාන්‍ය දෙමළ මිනිස්සුත් පිළිගත්තා ප්‍රභාකරන් කියන්නෙ චෝල අධිරාජ්‍යය නැවත ලෝකෙ ගොඩ නගන්න අවුරුදු දහස් ගණනකට පස්සෙ මිහිපිට පහළවුණු දෙමළ ගැලවුම්කාරයා හැටියට. **ප්‍රභාකරන්** කියන නමේ තේරුම වන **සූර්යයා** යන්නට ඇතැම් දෙමළ කවීකයො **සූර්ය දේවතා** යන නාමය පටබැඳලා මේ මහ කොටියට ගෞරව දක්වන්න පටන් ගත්තා. මේ පිස්සුව වැඩියෙන්ම ආවෙ තමිල් නාඩුවෙන්. ඉන්දියාවෙ අනිතා ප්‍රතාප් කියන ලේඛිකාව ප්‍රභාකරන් ඉහළම තලයට උස්සලා තියලා ලිපි ලියලා තිබුණා. ප්‍රභාකරන් යුද්ධයට අතිදක්ෂයෙක් බව ඇය ලියලා තිබුණා. ඉන්දියාවෙ ආදිකාලයේ රාජ්‍ය පාලනය ගැන න්‍යායවල් නිර්මාණය කළ කෞටිල්‍ය වැනි තීක්ෂණ බුද්ධිමතෙක් හැටියට ප්‍රභාකරන් ගණන් ගතයුතු යයි ඇය ලිව්වා. මේ පව අහලා ලෝකයා රැවටුණා විතරක් නෙවෙයි, ලංකාවෙ නැසීගිය ජනාධිපති ප්‍රේමදාස වරක් කියලා තිබුණා ප්‍රභාකරන් ශ්‍රීලංකා හමුදා නායකයා කරන්නට ඇත්නම් කියලා. අද ප්‍රේමදාස මහත්තෙයා හිටියනම් කියලා මට හිතෙනවා. කොටින්ට බටහිර මාධ්‍යයෙනුත් සැලකිල්ල ලැබුණා. ඒ කාර්‍යයට බටහිර රටවල ඉන්න කොටි සපෝටර්ලා නොමසුරු සල්ලි වියදම් කරලා ටෙලිවිෂන් මාධ්‍ය කණ්ඩායම් ලංකාවට එවලා කොටින්ට උපරිම ප්‍රචාරය ලබා දුන්නා.

මේ සේරම දේවල් වෙද්දි කොටි ටික ටික ඊළම් රාජ්‍යයට අවශ්‍ය දේ සම්පාදනය කරගත්තා, අපේ හිටපු ආණ්ඩුවල හිටී ගොන් නිලධාරීන් ගොනාටම අන්දගෙන. බැංකු, පොලීසි, උසාවි, ආදායම් බදු එකතු කිරීම්, තැපැල් කන්තෝරු, මුදල් නෝට්ටු, මුද්දර ඔය ආදී සියළුම දේ වලින් සම්පූර්ණ වුණා. ආයුධ නැව් ගණන් ගෙනැල්ලා ගබඩා කරගත්තා. සල්ලි දීලා නැව් තුනහතරක් ගත්තා. ඩොලර් කෝටි ගණනක අරමුදලක් එකතු කරගත්තා. මේ අතරම දිගටම බෝම්බ පිපිරෙව්වා. රටේ දේපළ විනාශ කළා. දහස් ගණනින් මනුෂ්‍ය ඝාතන කළා.

මේ සේරම දේවල් සිද්ධවෙද්දි කිසි බයක් නැතුව සැලෙන්නෙ නැතුව තමන්ගෙන් රටට ඉටුවිය යුතු කාර්‍ය අවංකවම කරපු පිරිසක් හිටියා. ඒ තමයි අපේ රටේ ප්‍රාණනාලිය වන ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක ඒකකය සහ දේශප්‍රේමී ජනමාධ්‍යය. මේ පිරිස් සතුරා කවුද යන්න පැහැදිලිව අවබෝධකරගෙන හිටියා. කළබල නොවී ඉවසිල්ලෙන් කරබාගෙන තමන්ගේ කාර්‍යය නොපිරිහෙලා කැපවීමෙන් ඉටු කළා. යකා කියන තරම් කලු නැති බව ඔවුන් දැනගෙන හිටියා.

අද මුළු ලෝකයේ ඇස්පනාපිට සත්‍යය එළිවෙලා තියනවා. කොටි සංවිධානය කියන්නේ අමු බොරුවක් බවත්, එය මෙතෙක් ලෝකයා රවටන්නට පුම්බා තැබූ පපඩමක් බවත් ඔප්පු වෙලා. සූර්ය දේවතාවා හැටියට හිටි මහ කොටියා සයනයිඩ් කරලත් වීසි කරලා පණ බයේ දුවනවා. වෙනම දෙමළ ඊළම් රාජයයක ජීවත්වෙන්න හීන මවපු දෙමළ ජනයා ලැජ්ජාවෙන් දැන් මූණ හංගගන්නවා. ඒවගේම ප්‍රමාණයෙන් කුඩා වුවත් ශ්‍රීලංකාව ශක්තිමත් කොඳුනාරටි ඇති වීරෝදාර දරුවන් සිටින, සැබැවින්ම පෙරදිග මුතු ඇටයක් බව දැන් මුලු ලොවම දන්නවා.

♦ වෙලේගෙදර රාළ London